# ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
## காணி, காணி அபிவிருத்தி அமைச்சு
## Ministry of Land and Land Development

"ගොවිජන මන්දිරය", 80/5, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල. "கொவிஜன மந்திரய", 80/5, ரஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
"Govijana Mandiraya", 80/5, Rajamalwatte Avenue, Battaramulla, Sri Lanka.

DEC 2007

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඉලඩී/12/1/1/29 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2007.11 |

7/11/12

චක්‍රලේඛ අංකය - 2007/04

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අවසර පත්‍ර නිකුත් කිරීම හා දීමනා පත්‍ර නිකුත් කිරීම.</u>**

ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල රජයේ ඉඩම්වල පදිංචිව සිටින අනවසරකරුවන් නියමානුකූල කිරීමේ දී හා ඉඩම් කච්චේරි පවත්වා සුදුස්සන් තෝරා ගැනීමේ දී ඉඩම් සංවර්ධන ආඥාපනතේ සලස්වා ඇති ක්‍රියා පරපාටි අනුගමනය නොකර අවසර පත්‍ර නිකුත් කිරීම සිදුවන බව පෙනී ගොස් ඇත. එසේම ව්‍යාජ බලපත්‍ර සකස් කිරීම පිළිබඳ සිද්ධි ද දැනට වාර්තා වී ඇත. මේ නිසා වහාම ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළයුතු බවට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

01. ප්‍රාදේශීය ලේකම්වරයෙකු හැර වෙනත් බලයලත් නිලධාරීන් විසින් අවසර පත්‍ර අත්සන් කිරීම වහාම අත්හිටුවන්න.

02. පළාත් ඉඩම් කොමසාරිස් හෝ ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් <u>ඉඩම් සංවර්ධන ආඥා පනතේ 20 "අ" වගන්තිය යටතේ</u> අවසර දෙනු ලැබූ අවස්ථාවක නිකුත් කරනු ලබන අවසර පත්‍රවල ඉහළ වම් කෙළවරේ එසේ අවසර දුන් ලිපියේ අංකය හා දිනය ද ඇතුළත් කර ඒ බවට සටහනක් යොදා එය ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කළයුතුය.

03. විධිමත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර පළාත් ඉඩම් කොමසාරිස් හෝ ඉඩම් කොමසාරිස් ජනරාල්ගෙන් අනුමැතියක් ලබා නොගෙන පවත්වා ඇති ඉඩම් කච්චේරි මඟින් තෝරා ගත් පුද්ගලයින්ට බලපත්‍ර නිකුත් කිරීම වහාම අත්හිටුවීමට කටයුතු කළයුතුයි.

04. විධිමත් සංවර්ධන සැලැස්මක් අනුමත කරගෙන පවත්වනු ලැබූ <u>ඉඩම් කච්චේරියක දී</u> තෝරා ගනු ලැබූ පුද්ගලයන්ට නිකුත් කරන බලපත්‍ර සම්බන්ධව පහත සටහන බලපත්‍රයේ වම් ඉහළ කෙළවර තබා, ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කළයුතුය. "ඉ.කො.ජ/ප.ඉ.කො.ගේ ............................ අංක .................................. දිනැති